# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2024

**11 ශ්‍රේණිය**

**නර්තනය - I**

නම/ විභාග අංකයඃ ........................................ කාලය ;- පැය 1 යි

**උපදෙස්**

★ **ප්‍රශ්න අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා ලකුණු කරන්න.**

1) මූලික සරඹ අභ්‍යාස කිරීමෙදී සිව් ගුණය වශයෙන් හඳුන්වනුයේ ........... ලයට නර්තනයේ යෙදීමය.
   i. විලම්භ  ii. මධ්‍ය  iii. ධෘත  iv. දෙගුණ

2) තුන් තිතේ තාල ප්‍රභේද ප්‍රස්තාරකරණයේ දී ............ යන සංකේත භාවිතා කරයි.
   i. ^ / ^  ii. ^ / /  iii. ^ ^ /  iv. / ^ /

3) වන්නම් ............ ලක්ෂණයන්ගෙන් යුත් නර්තන අංගයකි.
   i. නෘත්‍ය  ii. නාට්‍ය
   iii. නෘත්ත  iv. තාලානුකූල

4) විටත් ඔවුන තුටත් සිතින ................ යන කවි පදය ඇතුළත් වන්නම
   i. මාත්‍රා 2 + 3 හා මාත්‍රා 3 + 3 ට අයත් මුසලඩි
   ii. මාත්‍රා 3 + 3 හා මාත්‍රා 3 + 4 ට අයත් තුරඟා
   iii. මාත්‍රා 2 + 4 හා මාත්‍රා 3 + 3 ට අයත් මුසලඩි
   iv. මාත්‍රා 3 + 4 හා මාත්‍රා 3 + 3 ට අයත් මුසලඩි

5) බුදුන් දෙවියන් සහ රජුන්ගේ වර්ණනා ඇතුළත් කාව්‍ය ............. ලෙස හැඳින්වේ.
   i. ප්‍රශස්ති  ii. නමස්කාර
   iii. හටන්  iv. තුන්සරණේ

6) "සත් දින දොස හැර දෙපා තබන්නේ" යන කවි පදය අන්තර්ගත ගායනා විශේෂය වන්නේ
   i. නමස්කාර කවි  ii. හත් අඩිය කවි
   iii. සිරසපාද කවි  iv. මෝල්ගස් කවි

7) මුල් කාලයේ දී උඩරට වන්නම් ........... රජුගේ විනෝදස්වාදය සඳහා ගායනා කළ බව සඳහන් වේ.
   i. දෙවන පරාක්‍රමබාහු  ii. කීර්ති ශ්‍රී රාජසිංහ
   iii. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ  iv. ශ්‍රී වික්‍රම රාජසිංහ

8) ගැට බෙරයේ වම් පසින් වාදනය කෙරෙන අක්ෂර වන්නේ
   i. තත්, ජිත්  ii. තත්, තොං  iii. ජිත්,නං  iv. තත්, නං

9) සොකරි හා කෝලම් නාටකවල චරිත ලක්ෂණ අතරින් සමානතා දක්වන චරිත දෙක වන්නේ
   i. සොකරි - නොංචි  ii. පරයා - හෙන්ච
   iii. පරයා - මුදලි  iv. හෙන්චා - ගුරුහාමි

10) කෝලම් නාටකයේ රංග භූමිය හා නේපථ්‍යාගාරය වෙන් කෙරෙන සැරසිල්ල හඳුන්වන්නේ

i. කරලිය
ii. තොරණ
iii. වෙස් අත්ත
iv. මල් යහන

11) ගැමි නර්තන අතර පුරුෂ පක්ෂයට හා කාන්තා ලාලිත්‍යයට වෙන්වූ නර්තනාංග වන්නේ

i. කඩු හා ලී කෙළි
ii. කළ හා කුළු
iii. පතුරු හා තාලම්
iv. කඩු හා කළගෙඩි

12) කථකලි නර්තනයේ අභිනය යොදා ගෙන නර්තන මාධ්‍යයෙන් අදහස් නිරූපණයට පාදක වෙන කාව්‍ය ග්‍රන්ථ වන්නේ

i. රාමායනය, භගවත්ගීතාව
ii. රාමායනය, අභිනය දර්පණය
iii. රාමායනය, නාට්‍යශාස්ත්‍රය
iv. භගවත් ගීතාව, නාට්‍ය ශාස්ත්‍රය

13) කථකලි නර්තනයේ භාවිත අවනද්ධ භාණ්ඩ වන්නේ

i. චෙන්ඩාව, එඩැක්ක
ii. චෙන්ඩා, ඉලතාලම්
iii. මද්දල, ඉලතාලම්
iv. එඩැක්ක, චෙන්ගිලම්

14) මුද්‍රා නාට්‍ය සඳහා ඉඟි නළුව යන වචනය ප්‍රථමවරට භාවිත කරන ලද්දේ

i. එස් පණීභාරතගේ - සත්පත්තිනි
ii. චිත්‍රසේන ඩයස් මහතාගේ - රාමාසීතා
iii. ප්‍රේමකුමාර එපිටවෙලගේ - දියසේන
iv. ප්‍රේමකුමාර එපිටවෙලගේ - සැලලිහිණිය

15) පාද හුරුකරගැනීමට තට් අඩව් යොදගන්නා නර්තන සම්ප්‍රදය වන්නේ

i. උත්තර භාරතීය - භරත නර්තනය
ii. දක්ෂිණ භාරතීය - භරත නර්තනය
iii. දක්ෂිණ භාරතීය - කථකලි නර්තනය
iv. උත්තර භාරතීය - කථකලි නර්තනය

16) මෙම ගිම්හාන ග්‍රීස්ම වූ කාලේ ... යන ගීතය ඇතුළත් නූර්තිය හා පද රචනා ශිල්පියා වන්නේ

i. ශ්‍රී වික්‍රම නූර්තිය - චාල්ස් ඩයස් ශූරීන්
ii. විදුර නාට්‍යය - ලූෂන් බුලත්සිංහයන්
iii. විදුර නාට්‍යය - නීතිඥ චාල්ස් ඩයස් ශූරීන්
iv. ශ්‍රී වික්‍රම නූර්තිය - බෙනඩික් ප්‍රනාන්දු

17) අංග රචනයක් ආරම්භ කිරීමේදී මුලින් ම අවධානය යොමු කරන කොටස වන්නේ,

i. නාසයයි
ii. නිකටයි
iii. දෙඇසයි
iv. නළලයි

18) සොකරි නාටකය සඳහා වන්නි ප්‍රදේශයේදී වාදනය කරනු ලබන්නේ

i. ගැටබෙරය
ii. උඩැක්කිය
iii. දවුල
iv. තම්මැට්ටම




19) "විහාරවල තේවාව සඳහා නියම වූ කුලවලින් පැමිණ කළගෙඩි සෙල්ලමේ යෙදෙන නළඟනෝ ...." යන දේශාටන වාර්තාව

i. මහනුවර යුගයේ ස්පිල් බර්ජන් දක්වා ඇත.
ii. මහනුවර යුගයේ රොබට් නොක්ස් දක්වා ඇත.
iii. මහනුවර යුගයේ ඉබන් බතුතා දක්වා ඇත.
iv. ගම්පළ යුගයේ ඉබන් බතුතා දක්වා ඇත.

20) විශ්මය නැමති ස්ථායි භාවය නිරූපණය කිරීමේදී උපාංගවල ඇතිවන වෙනස්කම් වන්නේ

i. ඇස් අඩවන් වීම, මුව විවර වීම
ii. ඇස් විශාල වීම, මුව විවර වීම
iii. ඇස් කුඩා වීම, මුව විවර වීම
iv. මුහුණ රත්පැහැ වීම, මුව විවර වීම

★ **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත සඳහන් රූප සටහන භාවිත කරන්න.**

| | 1 | 2 | 3 |
|---|---|---|---|
| A |  |  |  |
| B |  |  |  |

21) හේවිසි වාදනය සඳහා යොද ගනු ලබන ප්‍රධාන අවනද්ධ භාණ්ඩ දෙක වන්නේ
  i. A තීරුව 2, B තීරුව 1
  ii. A තීරුව 1, B තීරුව 1
  iii. B තීරුව 1, A තීරුව 1
  iv. B තීරුව 2, A තීරුව 2

22) ගැමි නර්තන සඳහා රංග උපකරණ ලෙස යොද ගනු ලබන වාද්‍ය භාණ්ඩ දෙක වන්නේ,
  i. A තීරුව 2, B තීරුව 1
  ii. A තීරුව 2, B තීරුව 1
  iii. A තීරුව 3, B තීරුව 2
  iv. A තීරුව 3, B තීරුව 3

23) අතීත සන්නිවේදනය ක්‍රියාවලිය සඳහා යොදගත් සහ පොකුරු බෙරය ලෙස හඳුන්වන වාද්‍ය භාණ්ඩ දෙක වන්නේ,
  i. A තීරුව 1, B තීරුව 1
  ii. A තීරුව 2, B තීරුව 2
  iii. B තීරුව 1, B තීරුව 3
  iv. A තීරුව 2, B තීරුව 1

24) මෙම වාද්‍ය භාණ්ඩ අතරින් දිගින් සමානවන වාද්‍ය භාණ්ඩ දෙක වන්නේ,
  i. A තීරුව 1, B තීරුව 3
  ii. A තීරුව 1, B තීරුව 2
  iii. B තීරුව 2, A තීරුව 2
  iv. B තීරුව 2, A තීරුව 2

25) පංච තූර්ය වර්ගීකරණයේ විතත හා ඝණ කාණ්ඩයන්ට අයත් වාද්‍ය භාණ්ඩ දෙක වන්නේ,
  i. A තීරුව 3, B තීරුව 1
  ii. A තීරුව 1, B තීරුව 2
  iii. B තීරුව 3, A තීරුව 3
  iv. B තීරුව 2, A තීරුව 3

26) "තෙයියත් තෙයි තා තිත් තෙයි තත්තා" මෙම පා සරඹය නමින් වේ.
  i. චක්‍ර අඩිය
  ii. තුන්පැති අඩිය
  iii. කරණම් අඩිය
  iv. පසුපෙර අඩිය

27) වජිරා චිත්‍රසේන මහත්මිය විසින් නිෂ්පාදනය කරන ලද ළමා මුද්‍රා නාට්‍ය වන්නේ
  i. සේපාලිකා, රන් කිකිළි, ගිනි හොරා
  ii. සේපාලකා, රන් කිකිළි, නූපුර රාවය
  iii. සේපාලිකා, රන් කිකිළි, තණ්හා ආශා
  iv. සේපාලිකා, නූපුර රාවය, තණ්හා ආශා

28) "වැලිතල අතරේ හෙමිහිට බසිනා නේරංජන ....." මෙම ගීතය ශ්‍රවණය කිරීමෙන් සිත තුළ ඇතිවන භාවයන් සුසංයෝගයෙන් ඇතිවන රසය වන්නේ
  i. කරුණා
  ii. ශෝක
  iii. ශාන්ත
  iv. උත්සාහ

29) ප්‍රතිවාදී ප්‍රහාරයන් වැළකීම, අත් මාරුව වැනි ක්‍රියාකාරකම් දැකගත හැකි ගැමි නර්තනයන් වන්නේ
  i. කඩු නැටුම, මෝල්ගස් නැටුම
  ii. කඩු නැටුම, ගොයම් කැපීම
  iii. මෝල්ගස් නැටුම, කුලු නැටුම
  iv. කඩු නැටුම, කුලු නැටුම

30) මල් මඩුපුරය, තොරණ් යාගය, යක් තුන්පදය යන නර්තනාංග අයත් නර්තන සම්ප්‍රදයන් පිළිවෙළින්
i. උඩරට, පහතරට, සබරගමු
ii. පහතරට, සබරගමු, උඩරට
iii. සබරගමු, උඩරට, පහතරට
iv. සබරගමු, පහතරට, උඩරට

31) කුදංත ගත දොං වට්ටමේ තාලරූපය වනුයේ
i. මාත්‍රා 4+4 තාලය
ii. මාත්‍රා 2+2+4 තාලය
iii. මාත්‍රා 2+2+3 තාලය
iv. මාත්‍රා 3+3+4 තාලය

32) ලීයෙන් සාදන ලද දුන්න සහ ඊතලය රංග භාණ්ඩ ලෙස භාවිතා කරනුයේ
i. තෙල්මේ නර්තනයේ දී
ii. මඩුපුරය නර්තනයේ දී
iii. දුනුමාලප්පුව නර්තනයේ දී
iv. අස්නේ නර්තනයේ දී

33) මාත්‍රා 2+3 දෙතිතට අයත් අලංකාර බෙරපදය වන්නේ
i. දොං ජිං ජිං තකට දොංතක
ii. ජිං තත්තත් ජිං කුද කුද
iii. දොංතකු දොං ජිං තරිකිට ජිංතක ජිංතක තරිකිට
iv. දොංතකු දොං ජිං තත් ජිං තත් ජිං තරිකිට

34) කොහොඹ කංකාරි ශාන්තිකර්මයට අයත් චාරිත්‍ර විධි දෙකකි.
i. මල පේ කිරීම, මඩු පේ කිරීම
ii. මල පේ කිරීම, මිල්ල කැපීම
iii. මල පේ කිරීම, කාල පන්දම් පූජාව
iv. තොටමෙට යාම, කාල පන්දම් පූජාව

35) තත්කඩ කඩතක ජිජිකුද .... ලෙස ආරම්භ වන කස්තිරම අයත් වන ගොඩ සරඹය වන්නේ
i. චන්ද්‍රිකා සරඹය
ii. බඹර සරඹය
iii. දෑත පැගීමේ සරඹය
iv. පැනීම් සරඹය

36) සැවුලා වන්නමට හා තුරඟා වන්නමට අයත් බෙර පද වන්නේ
i. දොං දොං ජිං ජිං ගජිගත - දොං ජිංත ගත දොංත
ii. දොං දොං ජිං ජිං ගජිගත - දොං ජිං ජිං තකට දොංතක
iii. දොං දොං ජිං ජිං ගජිගත - දොං දොංත ගත දොංත
iv. දොං දොංත තක දොං - දොං ජිංත ගත දොංත

37) උඩරට නර්තන සම්ප්‍රදයට පමණක් ආවේණික රංග වස්ත්‍රාභරණ කට්ටල වනුයේ
i. වෙස්, නෛයඩි, තෙල්මේ
ii. වෙස්, නෛයඩි, තාලම්
iii. වෙස්, නෛයඩි, උඩරට
iv. වෙස්, නෛයඩි, පන්තේරු

38) උඩරට සම්ප්‍රදයට පමණක් ආවේණික පාරිභාෂික වචන වනුයේ
i. කස්තිරම, සරඹ, අඩව්ව
ii. කස්තිරම, ගොඩසරඹ, ඉරට්ටිය
iii. කස්තිරම, සීරුමාරුව, කලාසම
iv. ගොඩසරඹ, සීරුමාරුව, කස්තිරම

39) තාං ජිං තත් තත් යන අඩව්ව නර්තනය කළ හැකි වනුයේ
i. කුදංත ගත දොංත වට්ටමට ය
ii. දොං ජිංත ගත දොංත වට්ටමට ය
iii. මුසලඩි වන්නමට හා හනුමා වට්ටමට ය
iv. සිංහරාජ වන්නමට හා හනුමා වට්ටමට ය

40) ගැටබෙරයේ කොටස් වන්නේ
i. කැපුම් හම, සුරත් තට්ටුව, කඩිප්පුව
ii. වෙනිවර, සුරත් තට්ටුව, හැක්ම
iii. වෙනිවර, කැපුම් හම, සුරත් තට්ටුව
iv. ගැටිය, සුරත් තට්ටුව, වෙනිවර